Department of Education,Sabaragamuwa Province/ Weekly School



## පසුගිය විභාග ප්‍රශ්න

**2010**

I. මුළුතැන්ගෙයි භාවිතා කරන උපාංගයක් නිර්මාණය කිරීමට පෙර සූදානම් වීමේදී ශිෂ්‍යාවක් විසින් ඇතිකර ගතයුතු පියවර 4 ක් නම් කරන්න.

II. සොහොයුරෙකුගේ කමිසයේ බොත්තමක් ගැලවී තිබිණි. එය නැවත සවි කළ යුතු අයුරු ලියන්න.

**2011**

I. උත්සවයක විශේෂ අමුත්තන් සඳහා තිළිණ කරන සිහිවටනයක් ලෙස උපාංගයක් නිර්මාණය කිරීමට තනි පැහැති රෙදි කැබලි, මුද්‍රිත රෙදි කැබලි, විවිධ වර්ණ වල නූල් සහ නූල් කැරලි සපයා ඇත. මෙම ද්‍රව්‍ය භාවිතා කරමින් සකස් කල හැකි උපාංගයක් නම් කර ඒ සඳහා සුදුසු මෝස්තරයක් ගොඩනගන්න.

II. කුෂන් කවරයක් මැසීමේදී අනුගමනය කල යුතු පියවර සඳහන් කරන්න.

III. ඇඳුම් නිර්මාණයේ මැසීමේ ශිල්පීය ක්‍රම භාවිතා වේ. එම ශිල්පීය ක්‍රම 03 ක් ඒවා යොදනු ලබන ස්ථාන සමඟ දක්වන්න.

**2012**

I. වාටි මැස්ම භාවිතා කර ඇඳුමක වාටිය මසා නිම කර ගන්නා අයුරු විස්තර කරන්න.

**2013**

I. සටහන් ලියන්න.

   (a) මූලික මැහුම් ක්‍රම

   (b) රෙදි පිරියම් කිරීම

**2014**

I. දරුවකුගේ ඇඳුම් අලංකරණය සඳහා භාවිතා කළ හැකි අත් සැරසිලි 02ක් නම් කරන්න
II. මැසීමේ කුසලතා උපයෝගී කර ගනිමින් නිර්මාණය කර ගත හැකි මුළුතැන්ගෙයි සඳහා ප්‍රයෝජනවත් හා අලංකරණය ගෙන දෙන උපාංගයක් නම් කරන්න. ඒ සඳහා දළ සැලැස්ම අඳින්න.
III. සටහන් ලියන්න
    (a) ඇඳුම් සඳහා බොත්තම් ඇල්ලීමේ ශිල්පීය ක්‍රම

**2015**

**I.** බිත්ති සැරසිල්ලක අද්දර අලංකාර ලෙස නිම කිරීම සඳහා යොදා ගන්නා ක්‍රම 02ක් නම් කරන්න. ඉන් එක් ක්‍රමයක් පැහැදිලි කරන්න.

**2016**

I. විසිත්ත කාමරයක තබා ඇති රවුම් හැඩැති කුෂන් එක සඳහා යොදන කුෂන් කවරයට සුදුසු මෝස්තරයක් අඳින්න.
II. විකර්ණාකාර පටි භාවිතා කර කුෂන් කවරයක අද්දර නිම කරන ක්‍රම 02ක් සඳහන් කරන්න.

**2017**

I. නූල් ඇඳීම සහ වාටි මැස්ම ඇඳුම් මැසීමේදී භාවිතා කරන මූලික මැහුම් ක්‍රම දෙකකි. මෙම මැහුම් ක්‍රම 02 මසා නිම කරන අයුරු පැහැදිලි කරන්න.

**2018**

I. අත්පිස්නා රෙදවනය ක්විල්ට් කර නිම කිරීමේදී අනුගමනය කරන පියවර 02ක් ලියන්න.
II. භෝජනාගාරයෙහි භාවිතා කරන අත්පිස්නා රෙදවනයක් සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න.

**2019**

I. දියණිය සඳහා නිමි ඇඳුම් මිළදී ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු 02ක් ඉදිරිපත් කරන්න.
II. මෙම නිවසෙහි විසිත්ත කාමරයේ භාවිතය සඳහා කුෂන් (Cushion) කවර මැසීමට සුදුසු කපුකෙඳි වලින් නිෂ්පාදිත රෙදි වර්ග 02ක් නම් කරන්න.